**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**මූල්‍ය අධ්‍යයන අංශය**
**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**
**විශ්වවිද්‍යාල ප්‍රවේශය 2019/2020**

**යෝග්‍යතා පරීක්ෂණය**

# ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ (ගෞරව) උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ප්‍රමුඛතම ශාස්ත්‍රාලීය දෙපාර්තමේන්තුවක් වන මූල්‍ය අධ්‍යයන අංශය වර්තමානයේ ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය පිළිබඳ (විශේෂ) උපාධි පාඨමාලාව, ව්‍යාපාර කළමනාකරණවේදී රක්ෂණය පිළිබඳ (ගෞරව) උපාධි පාඨමාලාව, ව්‍යාපාර කලමනාකරණවේදී බැංකුකරණය පිළිබඳ (ගෞරව) උපාධි පාඨමාලාව යන උපාධි පාඨමාලා පිරිනමනු ලබන අතර එම උපාධි පාඨමාලා මූල්‍යකරණය, රක්ෂණය, බැංකුකරණය යන ක්ෂේත්‍රයන්ට විශේෂිත වේ. තවද මූල්‍ය සේවා වෙළඳපොලට සුදුසු හා ගැලපෙන විද්‍යාර්ථයින් බිහිකිරීමේ අරමුණින් ව්‍යාපාර කළමනාකරණවේදී මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ (ගෞරව) උපාධි පාඨමාලාව ද මූල්‍ය අධ්‍යයන අංශය විසින් හඳුන්වා දී ඇත.

සීග්‍රයෙන් වෙනස් වන මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ විශේෂිත දැනුමෙන් හෙබි උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කර ගෙන මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. එහි විෂය පථය සැකසී ඇත්තේ අවදානම් කළමනාකරණය, මූල්‍ය ආකෘති නිර්මාණය හා මූල්‍ය උපකරණ සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි නිපුනතාවයෙන් හා දැනුමෙන් සමන්විත අනාගත වෘත්තිකයින් බිහිකිරීම උදෙසාය. මූල්‍ය ඉංජිනේරුකරණයට අදාළ ප්‍රධාන විෂය ඒකකයන් වන මූල්‍ය සඳහා ගණිතමය ආකෘති නිර්මාණය, මූල්‍ය පිළිබඳ අනුරූපන ශිල්ප ක්‍රම, කාර්යක්ෂම ගණිතය හා ප්‍රශස්තකරණය යනාදී ඒකකයන් ගෙන් මෙම පාඨමාලාව සමන්විත වේ. **මෙම උපාධි පාඨමාලාවේ සියලුම දේශන සහ විභාගයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.**

මෙම සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාව සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ විශේෂ වූ ක්‍රමවේදයකට අනුවය. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අපේක්ෂකයින් යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ආකෘතියට අනුකූලව සකසා ගත් ඉල්ලුම් පතක් පහත දැක්වෙන ලේඛන පිටපත් ද සහිතව ලියාපදිංචි තැපැල් මගින් කැලණිය විශ්වවිද්‍යාලයට එවිය යුතුය.

අපේක්ෂකයින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කළ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - 2019/2020, අත් පොතෙහි අංක 2.2.8 සහ 2.2.8.36 යටතේ දැක්වෙන අවම සුදුසුකම් සපුරා සිටිය යුතුය. ඊට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂකයන් යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිට එහි අවම නිර්ණායක සපුරාලීම අවශ්‍ය වේ.

පහත දැක්වෙන අවශ්‍යතා සපුරාලූ අපේක්ෂකයන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

(අ) 2019 වර්ෂයේ අ.පො.ස.(උ/පෙළ) විභාගයට පෙනී සිට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අත්පොතෙහි උක්ත 2.2.8 හා 2.2.8.36 (පිටුව 119 හා 120) ඡේදයට අනුකූලව කවර හෝ විෂය ධාරාවකින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබා තිබීම.

## යෝග්‍යතා පරීක්ෂණය

අයදුම් පත්‍රය පහත දක්වා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ පත්‍රයක සැකසිය යුතුය. එමෙන්ම අයදුම්පත්‍රය මූල්‍ය අධ්‍යයන අංශයේ වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑල මගින් නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට **2020 ජූලි 06** දින හෝ එදිනට ප්‍රථම එවිය යුතුය. ඉල්ලුම් කරන ලද කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මූල්‍ය ඉංජිනේරුකරණය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. පහත සඳහන් සියලුම ලියකියවිලිද එම කවරයේ ඇතුලත් කළ යුතුය.

1) කැලණිය මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 055-1001-30667553 දරන ගිණුමට රු.1000/ක් බැර කොට ලබාගත් බැංකු රිසිට් පත,

2) විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරවරයකු විසින් සිය නිල මුද්‍රාව තබා සහතික කරන ලද අ.පො,ස. (උ/පෙළ) 2019 "Z" අගය සහිත ප්‍රතිඵල ලේඛනයක්

3) ඉහත ලේඛනවල හා ඉල්ලුම් පත්‍රයේ තම නම සඳහන් වන ආකාරයේ වෙනසක් ඇතොත්, එකී වෙනස් නම්වලින් හැඳින්වෙන තැනැත්තා/ තැනැත්තිය එක් අයෙකු බව තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්

අදාළ නිර්ණායක හා අවශ්‍යතා සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය අදාළ අපේක්ෂකයන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ. පරීක්ෂණයේ අරමුණ අපේක්ෂකයන්ගේ ගණිතමය හා ඉංග්‍රීසි ප්‍රවීණතාව, සාමාන්‍ය දැනීම සහ විශ්ලේෂණ හැකියාවන් පිළිබඳව ප්‍රවීණතා ඇගයීමයි. **යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.**

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
2020 ජූනි 08

---

**UNIVERSITY OF KELANIYA**
**Bachelor of Business Management Honours in Financial Engineering - 2019/2020**
**Aptitude Test**

(Please fill English using BLOCK letters)

1. Full Name of Candidate (Mr. / Ms.):
2. Surname of Candidate with Initials:
3. National ID No:
4. Permanent Address:
5. Telephone No.: Residence: - Mobile:-
6. District in which the candidate sat for the G. C. E. (A/L) Examination 2019:
7. Results at the G. C. E. (A/L) Examination 2019:

A/L Index No: Z - Score: ☐.☐☐☐

| Subject | Grade | Subject | Grade |
|---|---|---|---|
| i. ________ | _________ | iii. _________ | _________ |
| ii. ________ | _________ | iv. _________ | _________ |

8. G. C. E. (O/L) Examination: Year ☐☐☐☐

Results for: Mathematics ☐ English ☐

I certify that the above particulars submitted by me are true and accurate.

……………… ……………………………
Date Signature of Applicant

**Note:**

i. Please ensure that you include (a) Deposit slip for Rs. 1000/- (b) Certified result copies of G.C.E. (A/L) 2019 and Z - Score (c) Affidavit, if documents carry a different name, in your application.

ii. Make sure you include your preference for B. B. Mgt. Honours in Financial Engineering in your application for admission to the University Grants Commission.